ජගත් ජේ එදිරිසිංහ

# පිණි

## අවසාන කොටස




අමන්දා කාලයකට පසුව තේ කෝප්ප දෙකක් සෑදුවා ය. ඈ සිටියේ කල්පනාවෙන් බර වූ සිතිනි. තේ කෝප්ප දෙකට දැමූ සීනි දිය කරමින් බොහෝ වේලාවක් හැඳිගාමින් සිටියේ ඒ කල්පනාව නිසා ය.

ඊයේ මහගෙදරින් පිටව ආවේ සැමගේම සිත් තුළ අපැහැදිලි සිත්තමක් තබා බව ඇය දනියි. සන්සුන්ව සිටියේ තාත්තා පමණකි. ඔහු කොන්දේසි විරහිතව අමන්දා ගේ අදහස හා එක්ව සිටියේ ය. ඒ වෙනුවෙන් තර්ක කළේ ය.

අම්මා සිටියේ උපේක්ෂාවෙනි. අන් සියල්ලන් ම තමා දෙස බලා සිටියේ මුග්ධ ලෙස කන්-දකින් පහළට පනින්නට තැත්කරන උන්මන්තකයකු දෙස බලන ආකාරයට යයි දැන් ඇයට සිතෙයි. ඔවුන් වෙනත් වචන වලින් නමුත් කීවේ ඒ අදහස ම නොවේ ද? කිසිවකු කියන කිසිදු වදනකින් කිසිවකු කරන කිසියම් ක්‍රියාවකින් සිත සසළ නොවෙයි. ඒ සියල්ල දෙස උපේක්ෂාවෙන් බලා සිටින්නට තරම් සන්සුන් මනසක් තමාට ලැබුණේ කුමන නම් ආශ්චර්යයකින්දැයි අමන්දා සිතුවා ය. ඒකාග්‍ර වූ සිතුවිල්ලෙන් නොසැලී සිටින්නට තරම් වූ මේ සා ශක්තියක් තමා තුළ කොතැන සැඟවී තිබුණිදැයි ඇය නොදත්තා ය.

මහත් ඕනෑ කමකින් දැඩි අවධානයකින් තමාගේ දකුණතේ මැණික්කටුව අසළින් ඇඟිලි තබා නාඩි බලමින් සිටි වයෝවෘධ හිමි නමගේ දෙනෙතේ ඇඳී තිබූ තිර බැල්ම අමන්දාට සිහිපත් වෙයි. එතුමන් ගේ බැල්මේ තිබුණේ දැඩි විශ්වාසයක් නොවේ ද? අංශු මාත්‍රයක හෝ අවිශ්වාසයක් තිබුණා නම් තමාට ප්‍රතිකාර කිරීම ප්‍රතික්ෂෙප කරන්නට උන්වහන්සේට කිසිවකුගෙන් තහනමක් නොතිබුණ බව අමන්දා දනියි. එතුමන් ගේ දැඩි විශ්වාසය මත සිය ජීවිතය ගැට ගසන්නට දෙවතාවක් සිතන්නට අමන්දා උත්සාහ නොකළා ය. විශ්වජිත් නම් වන සුන්දර මිනිසා විසින් දල්වන ලද, අතැර දා යන්නට නියමිතව තිබූ ජීවිතය පිළිබඳ බලාපොරොත්තුවේ පහන් සිළෙහි ආලෝකය තව තවත් තීව්‍ර කරන්නට උන්වහන්සේ ගේ දෑස් වල දීප්තිය සමත් වූ බව පමණක් අමන්දා දැන සිටියා ය.

තේ කෝප්ප දෙක දෑතින් ගත් අමන්දා සාලයට ආවා ය. නිමන්ත හිස ඔසවා ඇය දෙස විමතියෙන් බැලුවේ ය. තමාගේ තේ කෝප්පය ටීපෝව මත තැබූ අමන්දා නිමන්ත වෙනුවෙන් තැනූ තේ කෝප්පය දෝතින් ම ඔහුට පිළිගැන්නුවා ය. අනතුරුව ඔහු ඉදිරියේ වූ හිස් සෝපාව මත වාඩි වූවා ය.

ඔහු තේ කෝප්පය අත තබා ගත්වන ම ඇය දෙස විමතියෙන් බලා සිටියේ ය.

"බොන්න..." ඈ පහත් හඬින් කීවා ය. එය සති ගණනාවකට පසු ඇය ඔහු වෙනුවෙන් වැය කළ පළමු වචනය විය. ඒ එකම වචනය ඊයම් බරුවක් මෙන් තම සිතේ පතුළට ම ගමන් කරනු ඔහුට දැනුණි. ඔහු කඳුළින් තෙත්වනු වළක්වාගනු වස් දෑස් පියාගත්තේ ය. කිසිවක් නොකියා ඇයට ඇහුම් කන් දීමට ඔහු සූදානම්ව සිටියේ ය.

"තේ එක බොන්න.. මට ඔයා එක්ක කතා කරන්න ඕනෙ.." ඇගේ වදන් නැවතත් ඔහුට ඇසුණි. ඔහු ඇය දෙස බැලුවේ ය. උගුරට දෙකට බිව් නමුත් ඔහු කවදත් ආසා කළ ඇගේ අතින් තැනෙන ප්‍රනීත තේ කෝප්පයේ රසය ඔහුට දැනුණි. ඔහු හිස් කෝප්පය ටීපෝව මත තබන තෙක් ඇය බලා සිටියා ය.

"කියන්න.." ඔහු කීවේ ය.

තමාට කියන්නට ඇති කාරණය වෙනුවෙන් සොයා ගත හැකි සුදුසුම වදන් එක්රැස් කරගන්නට අමන්දා තත්පර කීපයක් වැය කළා ය.

"මම.. මම ඩොක්ටර් සිරිමාන්නගෙ ට්‍රීට්මන්ට්ස් නවත්තන්න තීරණය කළා.." අනතුරුව ඇය කීවා ය. පිස්සු ද යි ඇගෙන් අසන්නට කටට ආ නමුත් ඔහු ඉවසිල්ලෙන් බලා සිටියේ ය. ඇය ම සියල්ල තේරුම් කර දෙන තෙක් ඔහු බලා සිටියේ ය.